අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/28/05(I)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020-08-25

සියලුම පීඨාධිපතිවරුන්/ විදුහල්පතිවරුන්/ගුරු විදුහල්පතිවරුන්/

ගුරුමධ්‍යස්ථාන කළමනාකාරවරුන්,

**අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2020**

මාගේ අංක ED/05/67/28/05(I)වෙළුම හා 2019-12-31 දිනැති ලිපිය මගින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ 2020 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් යෝජනා හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුවේ තීරණ මේ සමග ඉදිරිපත් කර ඇති අතර එය www.moe.gov.lk වෙබ් අඩවියේ ද පළ කර ඇත.

03. මෙම සමාලෝචන කමිටුවේ තීරණ අනුව සියලුම ස්ථාන මාරුවීම් 2020-09-02 දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව අනුප්‍රාප්තිකයන් සේවයට වාර්තා කරන තෙක් නොසිට ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධරයන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරී භාර ගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් 2020-09-01 දින සේවයෙන් පසු මුදාහැරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු ලැබූ නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

05. තවද වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා මාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කර ඇති ආකෘති පත්‍ර අංක - 5A සම්පූර්ණ කර 2020- 09-18 දිනට පෙර මා වෙත ඉදිරිපත් කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

කේ.ජී. විජේසිරි

අතිරේක ලේකම්(පාලන)

අධ්‍යාපන ලේකම් වෙනුවට

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk